The Journal of Humanities (JHU) (2025), Volume 33, Issue 2, 141-152
ISSN 1391-5096 (Print), ISSN 2783 – 8951 (Online)

# ආගම සහ බුදුදහම

ගාමිණී විජයසිංහ

## Abstract

Religion has been a central concept shaped by human beings since the earliest periods of history. It is well known that religion has played a major role in giving meaning to social existence. Yet, by today's standards, the historical evolution of religion is often overlooked. Against this background, it is evident how religion has become a form of spiritual heritage. This raises several questions: What is the nature and function of religion, and what is its utility in human progress? Religion provides a foundational framework for discussing such issues. However, to what extent is it reasonable to include Buddhism within the common category of religion? This proposition is examined as a central focus. Furthermore, an analysis of the historical background underlying the emergence of Buddhism as a religion is also presented.

**Keywords:** *Religion, concept, spiritual, Buddhism*

## හැඳින්වීම

ආගම වනාහී මානව පරිණාමයේ ප්‍රාථමික අවධියේ සිට මිනිස් චර්යාවේ දිශානතිය නියාමනය කිරීමෙහි ලා උපස්තම්භක වූ සුවිශේෂී ප්‍රස්තුතයකි. එය හුදෙක්ම සංකල්පනාත්මක හෝ කාල්පනික විෂය පථයක් දෘශ්‍යමානව පවතින නිසා නිශ්චිතවම අර්ථකථනය කිරීම අතිශයින් දුෂ්කර වී ඇත. කෙසේ වෙතත් ඉංග්‍රීසි භාෂාවේ දැක්වෙන Religion යන වචනයේ සිංහල පරිවර්තනය සඳහා ආගම

යන වචනය යෙදෙන අයුරු දැකගත හැකිය. එය ලතින් භාෂාවේ දැක්වෙන දෙවියන් වහන්සේ හෝ දෙවිවරු කෙරෙහි ඇති බිය මෙන්ම අභිචාරවිධි වැනි අරුත් ගෙනදෙන Religio යන වචනයේ තත්භවයකි. එවැනි ශාබ්ධිකාර්ථයක් සහිත ආගමේ විෂයාර්ථය නිර්ණය කිරීමෙහි ලා බහුවිධ දෘෂ්ටිකෝණ ඇසුරින් නිරීක්ෂණය කරන ලදුව ආගමේ ස්වභාවය සම්බන්ධයෙන් නොයෙක් සංසිද්ධි ඇසුරින් තහවුරු කරගත් පොදු නිර්ණායක රැසක් දැකගත හැකිය. විශේෂයෙන් ලෝක ආගම් ව්‍යවහාරයෙහි ලා පොදුවේ සැලකීමේදී බුදුදහමද ආගමකි. ව්‍යවවහාරික බුදුදහම තුළ එම පසුබිම තහවුරු කිරීමට අදාළ කරගත හැකි ආගමික සංකල්ප සමූහයක් නිරීක්ෂණය කිරීමේ හැකියාවද පවතී. එහෙත් මූලික බුදුදහම හා එහි ස්වභාවය විමර්ශනය කිරීමේදී ආගම වශයෙන් ව්‍යවහාර වන විෂයක්ෂේත්‍රයෙහි ලා සමපාත කළ හැකි කිසිදු ආකාරයේ විග්‍රහයක් ඍජුව හෝ වක්‍රව හඳුනාගත නොහැකිය. එබැවින් අනෙකුත් ආගම් සමඟ බුදුදහම එකම ආකෘතියකින් නම්කිරීමට යොමුවීම කෙතෙක් දුරට යෝග්‍ය වන්නේද යන ගැටලුව නිරායාසයෙන්ම ඉස්මතු විය හැකිය. එහෙයින් ආගම යන පොදු වපසරිය තුළ බුදුදහම කවරනම් ස්ථාවරයක්හි ලා බහාලිය හැකිවේදැයි න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික පසුබිම පිළිබඳ සමාජීය හා ඓතිහාසික නයින් කෙරෙන විමර්ශනාත්මක නිරීක්ෂණයක් මෙම පර්යේෂණය මගින් සිදුවේ.

## පර්යේෂණ ගැටලුව

මෙම පර්යේෂණයෙහි ලා ආගම යන්නෙන් අදහස් වන විෂයක්ෂේත්‍රය කවරේද එම විෂය සන්ධාරය සමඟ ගැළපීමේදී බුදුදහම ආගමක් ලෙස නිර්වචනය කිරීමේ යෝග්‍යා'යෝග්‍යතාව කවරේදැයි විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුවයි.

## පර්යේෂණ අරමුණු

ආගම යන්නෙහි පොදු ව්‍යවහාවාර්ථය ප්‍රස්තුත වියක්ෂේත්‍රයට කේන්ද්‍රගතව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙහි ලා විෂය කරගනු ලබන මූලික අරමුණයි. ඊට සාපේක්ෂකව බෞද්ධ චින්තාවේ ස්වභවය පිළිබඳ තුලනාත්මකව විශ්ලේෂණය කිරීමද අරමුණු කර

ගැනේ. එමෙන්ම බුදුදහම ආගමක් වශයෙන් .ව්‍යවහාර කිරීමේ යෝග්‍යතාව තවත් අංශයකින් විභාග කිරීම හැරුණුවිට මුල් බුදුදහමේ පදනම ව්‍යවහාරික පසුබිම සමග සමීකරණයවීමෙහි ලා උපස්තම්භක වූ අයුරු පරීක්‍ෂා කිරීම මෙම පර්යේෂණයෙහි ලා අරමුණු වශයෙන් අදාළ කරගැනේ.

## සාහිත්‍ය විමර්ශනය

බුදුදහමේ ස්වභාවය මෙන්ම එහි අනන්‍යතාව පිළිබඳ විවිධ දෘෂ්ටිකෝණ ඇසුරින් බොහෝ ප්‍රාමාණික විද්වතුන් විසින් කරන ලද පර්යේෂණ ගණනාවක් මෙම අධ්‍යයන ක්‍ෂෙත්‍රයෙහි ලා හඳුනාගත හැකිය. ඒ අතර වර්ෂ 1959 දී ප්‍රකාශයට පත් කර ඇති මහාචාර්ය වල්පොල රාහුල හිමියන් විසින් රචනා කරන ලද බුදුන් වදාළ ධර්මය නම් කෘතිය ඉතා වැදගත් වේ. බුදුදහමේ මූලික අනන්‍යතා ලක්‍ෂණ පිළිබඳ ප්‍රධාන වශයෙන්ද ආගම ප්‍රස්තුතය තුළ බුදුසමයේ භාවිතාව පිළිබඳ කෙටි විග්‍රහයක්ද එහි දැක්වේ. එමෙන්ම පාතේගම ඤාණාරාම හිමියන් රචනා කළ මුල් බුදුසමය හා විවරණ ගැටලු නම් කෘතියද මෙහි ලා වැදගත් වේ. බෞද්ධ චින්තාවේ ස්වභාව හා පසුබිම පිළිබඳ විමර්ශනය කිරීමෙහි ලා එහි උපයෝගීතාව විශේෂයෙන් සැලකිල්ලට ගත හැකිය. තවද මහාචාර්ය, එම්.එම්.ජේ. මාරසිංහ විසින් 1912 දී රචනා කළ බුදුදහම හා බුද්ධාගම නම් කෘතියද මෙම ක්‍ෂෙත්‍රයෙහි ලා ප්‍රශස්ත කෘතියකි. මුල් බුදහමේ යථාර්ථවාදී පදනම මෙන්ම එහි ආගමික හා සංස්කෘතික මුහුණුවර පිළිබඳ කෙරෙන විමර්ශනයක් දැකගත හැකිය. සමස්තයක් ලෙස යථෝක්ත කෘති මගින් කතුවරුන්ගේ මූලික ප්‍රස්තුතය තහවුරු කිරීමෙහි ලා දැක්වෙන ප්‍රයත්නයන් දැකගතහැකි වුවත් ආගම යන්නෙන් අදහස් කෙරෙන විෂය පරාසය හා ඊට සමාන්තරව ආගමක් වශයෙන් බුදුදහම අර්ථකථනය කිරීමේ යෝග්‍යායෝගතාව පිළිබඳ පුළුල් විමර්ශනයක් මෙම පර්යේෂණයෙහි ලා අවධාරණය වන බව සඳහන් කළ යුතුය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයෙහි ලා මූලික වශයෙන් පුස්තකාල ග්‍රන්ථ අධ්‍යයන ක්‍රමවේදය භාවිත කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව පාලි

සූත්‍ර සාහිත්‍යය ප්‍රධාන ප්‍රාථමික මූලාශ්‍රය ලෙස භාවිත කිරීමට අපේක්‍ෂා කෙරේ. එමෙන්ම මෙම විෂයක්‍ෂේත්‍රය පදනම් කරගෙන නොයෙක් ප්‍රාමාණික විද්වතුන් විසින් මුද්‍රණද්වාරයෙන් ප්‍රකාශයට පත් කරන ලද පර්යේෂණ ලිපි ග්‍රන්ථ හා වෙනත් ලේඛන ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාවිත කිරීමට අපේක්‍ෂා කෙරේ.

## සාකච්ඡාව

ආගම යන ව්‍යවහාරය හුදෙක්ම සංකීර්ණ ප්‍රස්තුතයකි. වාර්ගික ආගම්, රාජ්‍ය ආගම්, ජාතික ආගම්, ප්‍රාථමික ආගම් හා ලෝක ආගම් ආදි ප්‍රභේද ආගමේ භාවිතය තුළ දැකගත හැකිය. ඒ අතුරින් මෙම අධ්‍යයනය ලෝක ආගම් නියෝජනය වන පරිදි ප්‍රධාන ආගම් හතර (හින්දු, බෞද්ධ, කතෝලික, ඉස්ලාම් ප්‍රස්තුතය ඇසුරු කරගත් ක්‍ෂේත්‍රය පදනම් කරගනිමින් ගොඩනැගේ. එබැවින් යථෝක්ත සන්දර්භය සැලකීමේදී දැනට සමාජගතව පවත්නා ආගම්වල ඇතැම් පොදු ලක්‍ෂණ පැවතියද ඒ ඒ ආගම්වලට ආවේණික අනන්‍යතා බහුතරයක් දක්නට ලැබීම නිසා ආගම යනු කුමක්දැයි විභාග කිරීම වඩාත් සංකීර්ණ වී ඇති බව පෙනේ. විශේෂයෙන් සෑම ආගමකම පවතින ආවේණික ලක්‍ෂණ ඇතුළත් වන පරිදි සෑම ආගමකටම එකඟ විය හැකි පොදු නිර්වචනක් ඉදිරිපත් කිරීම අසීරු වී ඇති බව පෙනේ. කෙසේ වෙතත් ආගම වනාහි සමාජීය නිෂ්පාදනයක් වන නිසා සමාජ අවශ්‍යතා වෙනුවෙන් යොමුවීම ආගමේ පොදු ලක්‍ෂණය වී ඇත. එමෙන්ම ආගමික ක්‍රියාවලියක විෂය පථය ප්‍රසාරණය වීමද සමාජ අපේක්‍ෂා ඇසුරින්ම සිදුවේ. කාලීන වශයෙන් විවිධ ස්වරූප ඇසුරින් පෙළගැසෙන සමාජ අර්බුද වෙනුවෙන් විසඳුම් සැපයීමට ආගමට සිදුවේ. එය ආගමේ පැවැත්ම යාවත් කාලීන කිරීමට තීරණාත්මව බලපෑම් ඇති කෙරේ.

යථෝක්ත පසුබිමට සාපේක්‍ෂකව ආගමට ආවේණික මූලික ලක්‍ෂණ කීපයක් හඳුනාගත හැකිය. ආගමේ ස්වභාවය විශ්ලේෂණය කිරීමේදී එම නිර්ණායක විශේෂයෙන් වැදගත් වේ. ඒ යටතේ පහත සඳහන් සාධක අදාළ කරගත හැකිය.

- භක්තිමය පදනම
- විමුක්ති කේන්ද්‍රීය බව
- පරලොව පිළිබඳ විග්‍රහය

- කර්මය පිළිබඳ විග්‍රහය
- සදාචාර විග්‍රහය
- සමාජ දර්ශනය

කීර්තිමත් මානව විද්‍යාඥයෙකු ලෙස ප්‍රකට එඩ්වඩ් බර්නෙට් ටයිලර්ගේ විග්‍රහය අනුව අතිමානුෂික හා අධිභූතයන් කෙරෙහි ඇති විශ්වාසය ආගම ලෙස සැලකේ.[1] මානුෂීය අනුභූතිය හා සාමාන්‍ය භෞතිකත්වයෙන් බැහැර වූ ස්වභාවය එයින් අර්ථවත් වේ. මීට සාපේක්ෂකව ලෝක ආගම්වල ආදිකර්තෘන්වහන්සේලා අතිමානුෂීය බලවේගයෝ වෙති. එම ශ්‍රේෂ්ඨ දෙවිවරුන්ගේ ක්‍රියාකාරකම් සැලකුවද අධිභූත තත්ත්වයක් ගනී. මෙය වූ කලී විශ්වාස මාත්‍රයෙන්ම තහවුරු කරගත් සංකල්පයන් ලෙස සැලකිය හැකිය. දෙවියන් වහන්සේගේ අස්තිත්වය තහවුරු කිරීමෙහි ලා ඒ ඒ ආගම්වලට ආවේණික විග්‍රහයන් පැවතියද මෙහි ලා පොදු නිර්ණායකය පමණක් අවධාරණය වන බව සැලකිය යුතුය. කෙසේ වෙතත් ආගම්වල දැක්වෙන භක්තිමය පදනම හුදෙක්ම විශ්වාසයට සාපේක්ෂකව ජනිත වන අයුරු දැකගත හැකිය. ඒ පමණටම අභිචාර විධීන්ද දැකගත හැකිය. මෙම මූලිකාංගය දේවවාදී ආගම්වල පොදු ස්වභාවය ලෙස සැලකිය හැකිය. ආගම්වල පැවැත්ම පිණිස යථෝක්ත පසුබිම ඉවහල් වන බව පෙනේ. මීට සාපේක්ෂකව බුදුදහම මානව කේන්ද්‍රීය දහමකි. එහි ශාස්තෘවරයා වන තථාගතයන් වහන්සේ මිනිසෙකි.[2] උන්වහන්සේ ක්‍රි. පූ . 06 සියවස තුළ සැබැවින්ම භාරතීය සමාජයේ ජීවත් වූ බවට ඓතිහාසිකවද විද්‍යාත්මකවද තහවුරු කිරීමේ හැකියාව ඇත. තවද බුදුරදුන්ගේ ශ්‍රේෂ්ඨ මානුෂීය ස්වභාවය තහවුරු කෙරෙන මූලාශ්‍රයද සුලබව සපයාගත හැකිය.[3] එමෙන්ම ධර්මයේ අයිතියක් බුදුරදුන්ටද නැත. බුදුවරු පහළ වුවත් නොවුණත් ධර්මය හෙවත් ලොව යථාර්ථය පවතී. එය බුදුරදුන් විසින් අවබෝධ කරගෙන ජනතාවගේ අවබෝධය සඳහා දේශනා කරන ලදහ.[4] ආගම්වල (දේවවාදී) මෙන් බුදුරදුන් නියෝජිතයෙකු නොවන

---

1. සිංහල විශ්වකෝෂය 2 කාණ්ඩය (1965) සංස්කෘතික දෙපාර්තමේන්තුව, 409 පිටුව
2. සරණංකර හිමි ගණේගොඩ (1973) බුදුහාමුදුරුවෝ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 131-136 පිටු
3. එම, 1-14 පිටු
4. උප්පාදාවා භික්ඛවේ තථාගතානං අනුප්පාදාවා... තං තථාගතෝ අභිසම්බුජ්ඣති... ආචික්ඛති, දේසෙති. අංගුත්තර නිකාය 1, (2006), බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා සංස්කරණය. පුනර්මුද්‍රණය 514 පිටුව.

අතර තමන්වහන්සේ දැක දැන පසක් කරගත් ධර්මය අවබෝධය සඳහා අන්‍යයන්ට දේශනා කිරීම බුදුරදුන්ගේ කාර්යභාරය වශයෙන් සැළකේ. එමෙන්ම තථාගතයන් වහන්සේට අන්‍යයන් සසරින් එතෙර වීමට අදාළ අනුශාසනා කිරීම හැර එතෙර කරවීමේ හැකියාවක්ද නොමැති බව අවධාරණය වේ.[5] තථාගතයන්වහන්සේ මග පෙන්වන අයෙකු පමණක් වන අතර එම මාර්ගයේ ගමන් කිරීම පුද්ගලයා සතු කාර්යභාරයකි මග්ගඤ්ඤූ, මග්ගවිදූ, මග්ගකෝවිදෝ වැනි යෙදුම් තථාගතවරු වෙසෙසීම පිණිස භාවිත වන්නේ එම පදනම නිසාය.[6] බුද්ධ දේශනාව අනුව බුදුරදුන් සරණයාම වනාහී හුදු විශ්වාස මාත්‍රයෙන් ඇති කරගත් භක්තිය මත සිදුනොවන්නකි. පාරම්පරිකව හෝ ලියාපදිංචිය මගින් පමණක් බෞද්ධයෙකු විය නොහැකිය යන ස්ථාවරය එහි ලා අවධාරණය කළ හැකිය. ඒ අනුව එය හුදෙක්ම විචාරාත්මක හා බුද්ධිමය ක්‍රියාවලියක් ඇසුරින් සිදුවිය යුතු සංසිද්ධියක් වශයෙන් සැලකිය හැකිය . මෙම පසුබිම තහවුරු කිරීමෙහි ලා මජ්ඣිම නිකායේ වීමංසක සූත්‍රාගත විග්‍රහය ඍජුවම අදාළ කරගත හැකිය. එම වාර්තාව අනුව අනුන්ගේ සිත් කියවීමේ ඥානයක් නොමැති විමර්ශකයා විසින් පළමුව බුදුරදුන් සම්මා සම්බුද්ධද නොවේද යන කරුණ පිළිබඳ විමර්ශනය කළ යුතුයැයි අවධරණය කෙරේ.[7] ඒ සඳහා අදාළ කරගත හැකි වූ අනුක්‍රමික ක්‍රියාවලිය පිළිබඳද බුදුරදුන් විසින්ම අනුදැනවදාරන ලදහ.[8] ඉතිහාසයේ කිසිදු සාමයික තත්වයක් තුළ නොලැබෙන අසීමිත නිදහසක් ශාස්තෘත්වය පිළිබඳ පර්යේෂණයටත් තථාගත ස්වභාවය තහවුරු කරගැනීමටත් අනුගාමිකයින්ට අවකාශ ලැබේ. යථෝක්ත ක්‍රමවේදය ඇසුරින් බෞද්ධයෙකු බවට පත්වීම වනාහී භක්තිය විශ්වාසය හෝ එවැනි බාහිර සාධක මත පදනම් වන සංසිද්ධියක් නොවන අතරම විචාරශීලී පදනමක් සහිත බුද්ධිමත්

---

5. තුම්හේහි කිච්චං ආතප්පං අක්ඛාතාරෝ තථාගතා, බුද්දක නිකාය 1, (2006), ධම්මපදපාලි, මහාවග්ග 4 ගාථාව බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා සංස්කරණය. පුනර්මුද්‍රණය 94 පිටුව.

6. සරණංකර හිමි ගණේගොඩ, ඉහත සඳහන් ග්‍රන්ථය 28 පිටුව.

7. වීමංසකේන භික්ඛවේ භික්ඛුනා පරස්ස චේතෝපරියායං අජානන්තෙන තථාගතේ සමන් චිතෝපරියායං අජානන්තෙන තථාගතේ සමන් නේසනා කාතබ්බා සම්මාසම්බුද්ධෝ වා නෝවා ඉති විඤ්ඤාණායාති, මජ්ඣිම නිකාය 1 (2006) බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා සංස්කරණය. පුනර්මුද්‍රණය 774 පිටුව

8. එම

තීන්දුවක් ලෙස සැලකිය හැකිය. පැහැදිලි දර්ශනයක් සහිතව බුදු සරණ ගිය එබඳු පුද්ගලයා කෙරෙහි බුදුරදුන් සම්බන්ධව ඇතිවන ශ්‍රද්ධාව ආකාරවතී සද්ධා යන්නෙන් වෙසෙසා ඇත. එය වනාහි දාර්ශනික පදනමක් සහිත දෘඪ හා අචලවූවකි.[9] දේවවාදී ආගම්වල ඇගයීමට ලක්වන බිය සන්ත්‍රාශය පදනම් කරගත් අන්ධ විශ්වාසයක් කිසිසේත් එහි ප්‍රකට නොවන බව අවධාරණය කළ යුතුය. ඒ නයින් සැලකීමේදී මුල් බුදුදහම ආගමක් ලෙස සැලකීම යුක්ති සහගත නොවන බව පෙනේ.

අමූලිකා ශ්‍රද්ධාව හෙවත් අන්ධ භක්තිය නොමැති හෙයින් ඊට සාපෙක්ෂකව අවිචාරවත් අභිචාර විධීන්ද මූලික බුදුදහමට ආවේණික නොවේ.[10] දීඝ නිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයට අනුව තථාගතයන් වහන්සේගේ ශරීර පූජාව සඳහා භික්ෂූන් යොමු නොවිය යුතු බව අවධාරණය කර ඇත.[11] මෙහිදී බුදුදහමේ ස්ථාවරය හුදෙක්ම ශාස්තෘත්වය පිදීම ධර්මයේ පරමාර්ථය නොවන අතර ශාස්තෘවරයා තහවුරු කරගත් යථාර්ථය වටහාගැනීමට අදාළ පිළිවෙත් අනුගමනය කිරීම මගින් ඉලක්කය සපුරාගත හැකි බවයි. භික්ෂු චර්යාව මුළුමනින්ම වෙන්ව ඇත්තේ යථෝක්ත ප්‍රතිපදාව ප්‍රායෝගිකකරණය පිණිසය. මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේ දැක්වෙන විග්‍රහය මගින් මෙම පසුබිම වඩාත් පහසුවෙන් තහවුරු කරගත හැකිය. එහි ධර්මය පහුරකට උපමා කර දේශනා කර ඇත, පහුරක් හෝ එවැනි මාධ්‍යයක් අවශ්‍ය වන්නේ ජලාශයකින් එතෙරවීම පිණිසය.[12] එමෙන්ම එම පහුරු මාධ්‍යය හසුරුවා භාවිත කරනුයේ එතෙරවීම අපේක්ෂා කරන පුද්ගලයාය. එවැවින් එතෙර වීම පිළිබඳ වගකීම එම පුද්ගලයාට පැවරේ. එවැන්නෙකු එතෙර වූ පසුව අපේක්ෂිත කටයුතු කිරීම මිස

9. එම - 750 පිටුව

10. කරුණාරත්න ඩබ්.එස්. (1992) බෞද්ධ දර්ශනය හා චරණය ගොළඹ. 11 සහ 88 පිටු

11. අබ්‍යාවටා තුම්හේ ආනන්ද හෝථ තථාගතස්ස සරීරපූජාය, දීඝ නිකාය 2, (2006) මහාපරිනිබ්බාණ සූත්‍රය බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා සංස්කරණය. පුනර්මුද්‍රණය 220 පිටුව.

12. කුල්ලූපමං වෝ භික්ඛවේ ධම්මං දේසිස්සාමි නිත්ථරණත්ථාය නෝ ගහණත්ථාය, මජ්ඣිම නිකාය 2 (2006) බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා සංස්කරණය. පුනර්මුද්‍රණය 356 පිටුව

එතෙර වූ මාධ්‍යයට සත්කාර කිරීමේ පමණක් නිරත වීම කිසිසේත් අදාළ නොවන්නා සේම ශාස්තෘවරයා හෝ ධර්මයට අවිචාරවත්ව පුදපූජා පැවැත්වීම ඇගයීමට ලක් නොවේ. මීට සමාන්තරව බෞද්ධ ආර්යමාර්ගය තුළ භක්තිමය පසුබිම ගොඩනැගීමේ පදනමක් සහිත පූජා චාරිත්‍ර කෙරෙහි අවම අගයක් ලැබෙන බව සඳහන් කළ යුතුය. පූජා යන වචනය බෞද්ධ සාහිත්‍යයේ විවිධ සන්දර්භ ඔස්සේ දැකිය හැකි වුවත් එය වර්තමානයේ පවතින ස්වරූපයෙන් අර්ථවත් නොවේ. විශේෂයෙන් කායික හා වාචසික සංවරයෙන් යුත් සීලයෙන්ද මානසික ඒකාග්‍රතාව පදනම්කරගත් සමාධියෙන්ද විදර්ශනා ප්‍රඥාවේද පරිපූර්ණත්වය යොමු ඇසුරින් යථාතත්වාවබෝධය ලැබීම මගින් පරමාර්ථ සාධනය කළ හැකි බව බුදුදහමේ පදනම වශයෙන් සඳහන් කළ හැකිය.

සෑම ආගමක්ම විමුක්ති කේන්ද්‍රීය වේ. එබැවින් නිශ්චිත වශයෙන්ම වර්තමාන ජීවිතයේ පරිසමාප්තියක් පිළිබඳ ඒ යටතේ අවධාරණය වේ. නිර්මාතෘ දෙවි කෙනෙකු පිළිබඳ අවධාරණය කරන සියලු දේවවාදී ආගම් දෙවියන්ගේ කැමැත්ත ප්‍රකාරව අපේක්ෂිත විමුක්තිය කරා යොමු කරවන බව මූලික විශ්වාසයයි. දේව ආඥාවට අවනත වීම පුද්ගලයා සතු එකම කාර්යභාරය බවට පත්වී ඇත. ඒ අනුව ලෝක ආගම් අතර දැක්වෙන හිඳු දහම බ්‍රහ්මත්වයද කතෝලික හා ඉස්ලාම් ආගම්වල ස්වර්ගප්‍රාප්තියද අවධාරණය කරන අතර ඒ ඒ ආගම්වල පිළිගැනෙන අසහාය ශාස්තෘත්වය විසින් බැතිමතා විමුක්තියට ඔසවා තබනු ලැබේ. දෙවියන් වහන්සේ කෙරෙහි භක්තිමත් වීම එහි ලා අත්‍යවශ්‍ය වේ. බුදුදහමේ විමුක්තිය ලෙස දැක්වෙන්නේ නිර්වාණයයි. එය වනාහි අවබෝධය තුළින් තහවුරු කර ගැනෙන අධිගමයකි. එය මරණින් මත්තෙහි නොව ප්‍රවර්තිත භවය තුළදී ලද හැකිය. සෝපදිසේස නිර්වාණය මගින් පිරිනිවීම තෙක් නිවන් අවබෝධ කළ භවයේ ජීවත් වේ. හින්දු ආගමික විශ්වාසය අනුව දක්වන විමුක්තිය ලැබීමෙන් පසු අමරණියත්වය අත්වේ. එමෙන්ම කිතුනුවන් මෙන්ම මුස්ලිම් බැතිමත්හු මරණින් මතු ස්වර්ගයේ හෝ අපායේ ඉපදේ. නැවත මරණය අත් නොවේ.[13] එහෙත් නිර්වාණය එසේ නොවන අතර නිර්වාණාවබෝධයෙන් අනතුරුව ඉපදීමක් සිදු

13. ද සිල්වා නලින් නිවන්මග (2006), 36 කලාපය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 117 පිටුව.

නොවේ. එමගින් ඉපදීමට අවශ්‍ය වන තෘෂ්ණා සංඛ්‍යාත සාධක ක්ෂය කිරීම ඊට හේතුවයි.[14]

මරණින් මතු ජීවිතය පිළිබඳ විග්‍රහයද ආගම්වල ලක්ෂණයකි. ඒ අනුව හින්දු දහම පුනරුප්පත්තියද ක්‍රිස්තියානි සහ ඉස්ලාම් ආගම්වල පුනරුත්ථානයද අනුමත කෙරේ. මළවුන්ගෙන් නැගී සිටීම පුනරුත්ථානයේ ස්වභාවයයි. දිව්‍ය විනිශ්චයකින් අනතුරුව දෙවියන් වහන්සේගේ ලෝකය හෙවත් ස්වර්ගය හෝ යක්ෂයාගේ ලෝකයට පමුණුවයි. ආත්මය බ්‍රහ්ම සහව්‍යතාව හෝ නිරයට යොමුකිරීම පිළිබඳ දැක්වෙන හින්දු ආකල්පයද මීටම සමපාත වේ. අනාත්ම දහමක් වූ බුදු සමය මේ සම්බන්ධයෙන් දැක්වෙන පුනර්භවය පිළිබඳ විග්‍රහය මුළුමනින්ම දිව්‍යමය අධිකාරිත්වයෙන් බැහැර වූ හේතුඵල සිද්ධාන්තය මත පදනම් වූ යථාර්ථවාදී ඉගැන්වීමකි. ආගම් ව්‍යවහාරය තුළ දෘශ්‍යමාන වන තවත් පොදු විග්‍රහයක් ලෙස කර්ම සංකල්පය හඳුනාගත හැකිය. කය, වචනය හා සිත මෙහෙයවීමෙන් සිදුකරනු ලබන ක්‍රියාව කර්මයයි. පොදුවේ පුද්ගලානුබද්ධ කර්මයෙන් ගලවා ගැනීමේ වගකීම දරනු ලබන්නේ දෙවියන් වහන්සේ විසිනි. උන්වහන්සේ කෙරෙහි භක්තිමත් වීම එහි ලා පුද්ගලයාගේ කාර්භාරයයි. එහෙත් මානව කේන්ද්‍රීය පදනමක් ඇසුරින් ලොව යථාර්ථය අනාවරණය කරන බෞද්ධ චින්තාව කර්මයේ වගකීම පුද්ගලයා වෙත් පැවරේ. යමෙක් විසින් කරනු ලබන කර්මයේ වගකීම කරන්නා දැරිය යුතුය. පාරිශුද්ධිය හෝ අපිරිසිදු බව ඒ ඒ පුද්ගලයාගේ ක්‍රියාව හෝ කර්මය බලපාන බව බෞද්ධ ස්ථාවරයයි.[15]

සදාචාරය පිළිබඳ ප්‍රස්තුතයද අ.ාගම යන ව්‍යවහාරය තුළ ප්‍රකට වන අනෙක් ප්‍රමුඛ සාධකයයි. මෙම ක්ෂේත්‍රය වුවද පොදුවේ දිව්‍යමය හා වාර්ගික පදනමකින් විග්‍රහ වන අයුරු දැකිය හැකි ලක්ෂණයකි. යථෝක්ත ආගමික පදනමකින් බැහැරවූ බුදුදහමේ දක්වෙන ආචාරාත්මක ශික්ෂණ ප්‍රතිපදාව වනාහි ඊටම ආවේණික අනන්‍යතාවෙන් යුත් විග්‍රහයක් වශයෙන් වශයෙන් හඳුනාගත හැකිය.

14. යථාපි මූලේ අනුපද්දවේ දළ්හේ ඡින්නෝපි රුක්ඛො පුනරේවරුහතී... බුද්දක නිකාය 1, (2006), ධම්මපදපාළි, තණ්හාවග්ග 5 ගාථාව, ඉහත සංස්කරණය 108 පිටුව.

15. අත්තනාව කතං පාපං..., ඛුද්දක නිකාය 1, (2006), ධම්මපදපාළි, අත්තවර්ගය 9 ගාථාව, ඉහත සංස්කරණය 66 පිටුව.

නිර්වාණය නම් වූ පාරප්‍රප්තිය වෙනුවෙන් පුද්ගලයා විසින් පෞද්ගලික හා සමාජ ශුභසාධනය පදනම් කරගනිමින් සිදුකරනු ලබන අනුපූර්ව ශික්ෂණ ප්‍රතිපදාවකි. එහි මානව කේන්ද්‍රීය පදනමක් මෙන්ම නිදහස් චින්තනයක් හා චරණයකින් යුත් පෘථුල මානව සම්බන්ධතා ජාලයක් සහිත පෞරුෂේය පදනමක් දැකගත හැකිය.

ආගම වනාහි සමාජීය නිෂ්පාදනයකි. එහෙයින් සමාජ අවශ්‍යතා වෙනුවෙන් එය පෙනී සිටිය යුතුය. මෙම තත්ත්වය තුළ බුදුසමය හැරුණු විට අනෙක් සියලු ආගම් වාර්ගිකත්වය, අන්තවාදිත්වය ප්‍රකට කළ අයුරු දැකගත හැකිය. බුදුදහම හැරුණු විට අනෙක් ආගම් තුනම බිහිවන්නේ ආක්‍රමණශීලී වාර්ගික ආගම් වශයෙනි. එබැවින් යථෝක්ත ප්‍රවණතාව උච්චාවචනය වෙමින් ඉතිහාසය මුළුල්ලෙහිම ක්‍රියාත්මක වූ අයුරු දැකගත හැකිය. බුදුදහමේ දැක්වෙන සමාජ ප්‍රස්තුතය වනාහී යථාර්ථවාදී පදනමක් ඇසුරින් ක්‍රියාත්මක වන ප්‍රායෝගික චින්තාවකි. බෞද්ධ සමාජ චින්තාවේ ප්‍රභවය සැලකීමේදී තත් කාලීනව වර්ධනය වී ඔඩුදුවමින් පැවති සමාජ අර්බුදවලට සර්වසාධාරණ ප්‍රතිචාර දැක්වීමෙහි ලා යොමුවූ දහමක් වශයෙන් අර්ථකථනය කළ හැකිය. විශේෂයෙන් බොහෝ දෘෂ්ටිගතික ආගමික ප්‍රවණතාවන්ගෙන් නොමගට හා උන්මාදයට පත්ව සිටි ප්‍රජාව නිශ්චිත දිශානතියට යොමු කිරීමෙහි ලා කාලාම, මංගල, වසල, පරාභව හා ව්‍යග්ඝපජ්ජ ආදී සූත්‍ර දේශනා මගින් නිසි මගට යොමු කර ඇත. කූටදන්ත සූත්‍රය, චක්කවත්ති සීහනාද සූත්‍රය ආදී දේශනා ඇසුරින් තත්කාලීන ආර්ථික, දේශපාලන හා සමාජ ආදී ක්ෂේත්‍රයන්හි ප්‍රකටව පැවති ගැටලු සඳහා සර්වකාලීන විසඳුම් ප්‍රදානය කිරීමෙහි ලා යොමුවී ඇති අයුරු දැකගත හැකිය.

## නිගමනය

යථෝක්ත සමස්තය විශ්ලේෂණය කිරීමේදී ආගම යන්නෙන් ව්‍යවහාර වන විෂයපථයෙහි ලා මුල් බුදුසමය බහාලිය නොහැකිය. බුදුදහම වෙසෙසීම පිණිස කෙනෙකුට කුමන හෝ වචනයක් ව්‍යවහාර කිරීමේ හැකියාව පවතී. එහෙත් බෞද්ධ චින්තාව වනාහි ජීවන ප්‍රතිපදා මාර්ගයකි. පුද්ගලයා නිර්වණය නම් වූ රේඛීය පරමාර්ථ සාධනයෙහි ලා එමගින් යොමුකරනු ලබයි. එවැනි තත්ත්වයක් තුළ

ආගම් මගින් සමාජගත කරන ලද චින්තන ප්‍රවාහයේ ප්‍රබලතාව හා ඒ ඒ පුද්ගලානුබද්ධ බුද්ධියේ වපසරිය පදනම් කරගෙන ඇතැමෙක් ආගමක් නොවූ බුදුදහම ආගමක් ලෙස ව්‍යවහාර කිරීමට උනන්දු වූහ. මෙම තත්ත්වය ඇතිවීමෙහි ලා බහුවිධ සාධක උපස්තම්භක වූ අයුරු දැකගත හැකිය. සාමාන්‍ය පොදු ජනතාවට බුදුසමය විවෘත වීම එහි පළමු අවස්ථාවයි. ක්‍රමානුකූලව තහවුරු වූ මෙම තත්ත්වය ධර්මාශෝක යුගයේ පැවති ආගම් සංස්ලේෂණය තුළ වඩාත් තීව්‍ර වූ අයුරු දැකගත හැකිය. මෙවැනි තත්වයක් තුළ හින්දු ආදී ඉන්දියානු ආගමික බලපෑමත් යුරෝපීය ආක්‍රමණ හා මුස්ලිම්වරුන්ගේ ආභාසයත් ආදී සංස්කෘතික සම්පර්කයන් පදනම් කරගෙන වර්තමානය වන විට බුදුදහම ආගමක් ලෙස ක්‍රමානුකූලව සංවර්ධනය වී ඇත. පුදපූජා, වත් පිළිවෙත්, අභිචාරවිධි මෙන්ම පරමාර්ථමය වශයෙන්ද බෞද්ධයාගේ අපේක්ෂිත අනන්‍යතාව ගිලිහී ඇතිබව පෙනේ. එහෙත් මුල් බුදුදහමේ ස්ථාවරත්වය මූලික වශයෙන්ද පශ්චාත්කාලීන බහුවිධ ප්‍රවණතාවන්ගෙන් සම්මිශ්‍රිත සවභාව තවත් අංශයකින්ද ලෙස සලකා බෞද්ධ චින්තාව පිළිබඳ අර්ථකථනය කළ හැකි බව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


**ප්‍රාථමික මූලාශ්‍රය**

අංගුත්තර නිකාය 1. (2006). *බුද්ධ ජයන්ති ග්‍රන්ථමාලා සංස්කරණ.* පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

දීඝ නිකාය 2. (2006). *බුද්ධ ජයන්ති ග්‍රන්ථමාලා සංස්කරණ.* පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

ධම්මපද පාලි. (2006). *බුද්ධ ජයන්ති ග්‍රන්ථමාලා සංස්කරණ.* පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

මජ්ඣිම නිකාය (1) *බුද්ධ ජයන්ති ග්‍රන්ථමාලා සංස්කරණ.* පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

**ද්විතීයික මූලාශ්‍රය**

කරුණාරත්න, ඩබ්. එස්. (1992). *බෞද්ධ දර්ශනය හා චරණය.* කොළඹ.

ඥාණාරාම හිමි, පාතේගම. (2007). *මුල් බුදුසමය හා විවරණ ගැටලු.* කොළඹ.

මේධානන්ද හිමි, දේවාලේගම. (1994). *බුදුසමය හා සාමයික පසුබිම.* අභය මුද්‍රණ ශිල්පියෝ කඩවත.

නානායක්කාර, සනත්. (1994). *බුදුදහම හා ලංකාවේ සෙසු ආගම්.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

මාරසිංහ, එම්. එම්. ජේ. *බුදු හදම හා බුද්ධාගම.* සරසවි ප්‍රකාශකයෝ කොළඹ.

රාහුල හිමි, වල්පොල. (1959). *බුදුන් වදාළ ධර්මය.* ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

රාහුල හිමි, වල්පොල. (2009). *ලක්දිව බුදුසමයේ ඉතිහාසය.* ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

සරණංකර හිමි, ගණේගොඩ. (1973). *බුදුහාමුදුරුවෝ.* ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

සාරානන්ද හිමි, දුනුකේ උල්ලේ. (2013). *සමයාන්තර ආගම් තුලනය.* සමන්ති ප්‍රකාශකයෝ, ජාඇළ.

**කෝෂ ග්‍රන්ථ**

බණ්ඩාර සිරිනාම ඒ. ජී. (2006). *බුදුගුණ නාමාවලී.* කතෘ ප්‍රකාශන.

ලියනගේ සිරි *බෞද්ධ ශබ්දකෝෂය.* (2014). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය දෙහිවල.

සෝරත නාහිමි, *වැලිවිටියේ සුමංගල ශබ්දකෝෂය 2.* (1952). මහාබෝධි යන්ත්‍රාලය කොළඹ.

*සිංහල විශ්වකෝෂය*, 2 කාණ්ඩය. (1965). සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.